# <u>මහජනතාව වෙත දැනුම් දීමයි</u>

**ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ අග්නිදිග ආසියාව, මැද පෙරදිග සහ බටහිර යුරෝපය සම්බන්ධ කරන 3 වන කේබලය (SEA-ME-WE-3 කේබලය) හානි වීමට බලපාන ලද හේතු පරීක්ෂා කිරීමේ ජනාධිපති විමර්ශන කමිටුව**

ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ SEA-ME-WE-3 කේබලය 2004 අගෝස්තු 22 වන දින නාවික යාත්‍රාවක ගැටීම නිසා හානියට පත්වීම හේතුවෙන් බොහෝ ප්‍රතිවිපාක වාර්තා වීම නිසා;

ඒ සම්බන්ධයෙන් සොයා බලා වාර්තාවක් ඉදිරිපත් කිරීමට කැබිනට් අමාත්‍ය මණ්ඩලයේ තීරණයක් ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් ඒක පුද්ගල විමර්ශන කමිටුවක් පත් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමා වෙත එම වාර්තාව ප්‍රදානය කිරීම පිණිස කෙරෙන විමර්ශනය පහත සඳහන් ලිපිනයේ පිහිටි ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභා පරිශ්‍රයේදී සිදු කරනු ලබයි.

එම කමිටුව ඉටුකල යුතු කාර්යයන් මෙසේය:

1. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ SEA-ME-WE-3 කේබලය හානිවීමට බලපෑ හේතු සාධක හඳුනා ගැනීම.
2. කිසියම් රාජ්‍ය ආයතනයක් හෝ ආයතන විසින් හෝ ඔවුන්ගේ සේවකයින් අතින් හෝ යම්කිසි වරදක් හෝ අතපසුවීම් සිදුවී ඇත්දැයි විමර්ශනය කිරීම සහ ඒ පිළිබඳව වාර්තා කිරීම.
3. කිසිම අවස්ථාවක ජාතික ආරක්ෂාව කෙරෙහි කිසිම අයුරකින් අනතුරක් හෝ අවදානමක් ඇති වූයේදැයි නිශ්චය කිරීම.
4. නීති නිලධාරීන් ගත් තීරණ හෝ නිශ්චයයන් දෝෂ සහගතව ගන්නා ලදදැයි සළකා බැලීම.
5. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට සිදුවූ පාඩු පියවා ගැනීම පිණිස නව සාක්ෂි සමග අධිකරණය මගින් පියවර ගත හැකි නොහැකි බව නිර්දේශ කිරීම.
6. ඉදිරියේදී රජයට හෝ රජයේ ඕනෑම ආයතනයට මෙවැනි අලාභ හානි සිදුවීම වලක්වා ගැනීම පිණිස ගතයුතු පියවර නිර්දේශ කිරීම.

මේ සම්බන්ධ සාක්ෂි හෝ අදහස් 2005 දෙසැම්බර් 21 දින හෝ ඊට පෙර ඉදිරිපත් කරන ලෙස කමිටුව මහජනතාවට මෙ මගින් දන්වා සිටිනු ලැබේ.

මහින්ද කටුගහ
සාමාජික
ජනාධිපති විමර්ශන කමිටුව
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව බාරේ
276, ඇල්විටිගල මාවත, කොළඹ 08.

දුරකථන: **2689345, 2689352, 2679827**
ෆැක්ස්: **5362362**
විද්‍යුත් තැපැල: seamewe3.pci@trc.gov.lk

2005 දෙසැම්බර් 01 දින.